මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
மனிதவலு மற்றும் வேலைவாய்ப்புத் திணைக்களம்
DEPARTMENT OF MANPOWER AND EMPLOYMENT

9 වන මහල
සෙත්සිරිපාය 2 වන අදියර
බත්තරමුල්ල

9th Floor
Sethsiripaya 2nd Stage
Battaramulla

9ம் மாடி
செத்சிரிபாய 2ம் கட்டம்
பத்தரமுல்லை

මගේ අංකය / எனது இல / My No: DME/01/10/10 (වා.ස්.මා)

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2018.07

දෙපාර්තමේන්තු චක්‍රලේඛ : 02/2018

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්ත,

වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී/ව්‍යාපෘති නිලධාරීන්
මානව සම්පත් සංවර්ධන සහකාර/සංවර්ධන නිලධාරීන්

**වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු - වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී/ව්‍යාපෘති නිලධාරී සහ මානව සම්පත් සංවර්ධන සහකාර/සංවර්ධන නිලධාරී**

අංක 1589/30 හා 2009.02.20 දිනැති (අති විශේෂ) ගැසට් පත්‍රයේ පලකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධාන වලටද මෙයට යා කර ඇති ස්ථාන මාරු ප්‍රතිපත්තියට ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් හා ව්‍යාපෘති නිලධාරීන් සහ මානව සම්පත් සංවර්ධන සහකාර හා සංවර්ධන නිලධාරීන්ට වාර්ෂික ස්ථාන මාරු 2019 ජනවාරි 01 සිට බලපැවැත්වෙන සේ ක්‍රියාත්මක කල යුතුය.

**01 ස්ථාන මාරු බලධරයා**

ස්ථාන මාරු නියෝග කිරීමේ බලධරයා මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන්නේ ය. ඔහු විසින් පත්කරනු ලබන කමිටුවක් මගින් ස්ථාන මාරු අයදුම්පත් දෙපාර්තමේන්තුවේ අදාළ ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූලව සමාලෝචනය කර නිර්දේශ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු ඇත. එම නිර්දේශ මත ස්ථාන මාරු නියෝග නිකුත් කරනු ඇත.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General 0112186022
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம் தொலைநகல / Office /Fax 011 2187131 011 2187133
ගිණුම් අංශය / கணக்குக்கிளை / Accounts Branch 011 2186173
විද්‍යුත් තැපැල / மின்னஞ்சல / e-mail dg@dome.gov.lk info@dome.gov.lk

**02. ස්ථාන මාරු අයදුම්පත්‍ර**

2.1 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා එවනු ලබන අයදුම්පත්‍රය මෙයට අමුණා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කර දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්/අංශ ප්‍රධානගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

2.2 එක් නිලධරයෙකු එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කල යුතුය.

2.3 අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී ඒ සඳහා ආකෘති පත්‍රයට අනුවම සකස් කල අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කල යුතු වේ.

2.4 සියළුම අයදුම්පත් 2018.08.31 දිනට පෙර ලැබෙන සේ මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය.

2.5 ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නිශ්චිත කාර්යාලයකට පමණක් නම් ඒ බව අයදුම්පතේ නිශ්චිතව සඳහන් කළ යුතුය.

2.6 දැනට ප්‍රසූති නිවාඩු ලබා සිටින නිලධාරීන් ඒ බව අයදුම්පත්‍රයේ සටහන් කල යුතුය.

**03. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව**

3.1 ස්ථාන මාරු යෝජනාවන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි 210 වගන්තිය අනුව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව පත්කර ඇත. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු ලබන්නේ කාර්ය පටිපාටික රීතීන් හි 211 වගන්තියට අනුකූල වේ නම් පමණි.

3.2 නිලධරයෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධරයාට හිමිකමක් නැත. ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් පහත සඳහන් කරුණු පිළිබඳ තවදුරටත් පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද ස්ථාන මාරුවීම්
- නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවුනු අවස්ථා (මනාප 1,2,3 යන සේවා ස්ථාන ඉල්ලීම් ලෙස සලකනු ලැබේ.)
- නිලධරයන්ගේ ඉල්ලීම වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්
- ස්ථාන මාරු අයදුම්කරන ලද දිනයෙන් පසුව නිලධරයන්ට සිදුවූ හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශිත ඉදිරිපත් කිරීම්

3.3 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ නිකුත් කළ පසු ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි XX වන පරිච්ඡේදයේ 230 වගන්තිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. සමාලෝචන කමිටුවට ඉදිරිපත් නොවූ අභියාචනා පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සළකා නොබලනු ඇත.

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம் 0112186022
Director General

කාර්යාලය/ෆැක්ස්
அலுவலகம் 011 2187131
தொலைநகல
Office /Fax 011 2187133

ගිණුම් අංශය
கணக்குக்கிளை 011 2186173
Accounts Branch

විද්‍යුත් තැපැල
மின்னஞ்சல
e-mail
dg@dome.gov.lk
info@dome.gov.lk

**04. ස්ථාන මාරු කාල සටහන**

ස්ථාන මාරු පිළිබඳව කටයුතු කිරීම සඳහා කාල සටහන

| | |
|---|---|
| අගෝස්තු 10 පෙර | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම |
| අගෝස්තු 31ට පෙර | නිලධාරීන්ගේ ස්ථාන මාරු යෝජනා ඉල්ලුම්පත් ලබාගැනීම සිදුකිරීම |
| සැප්තැම්බර් 22ට පෙර | ස්ථාන මාරු කමිටුව විසින් ස්ථාන මාරු යොජනා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම. |
| සැප්තැම්බර් 29ට පෙර | ස්ථාන මාරු තීරණ නිලධාරීන්ට දැනුම් දීම |
| ඔක්තෝම්බර් 13ට පෙර | අභියාචනා ඉදිරිපත් කිරීම |
| නොවැම්බර් 06ට පෙර | සමාලෝචන කමිටු තීරණ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම්දීම |
| නොවැම්බර් 15ට පෙර | නිලධාරීන්ට සමාලෝචන තීරණ දැනුම්දීම |
| නොවැම්බර් 29ට පෙර | රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කිරිම |
| ජනවාරි 01 | වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු දිනය |

**05. වාර්ෂික ස්ථාන මාරු පසුවිපරම් කටයුතු**

වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව 2019.02.15 දිනෙන් පසු පසුවිපරම් කමිටුවක් මගින් අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ.

**06. නිලධරයන්ගේ වගකීම්**

වාර්ෂික ස්ථාන මාරු ලැබූ සියලුම නිලධරයෝ නියමිත දිනයේදී නව රාජකාරී ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැදී සිටිති.

මෙම චක්‍රලේඛයේ දක්වා නොමැති විධිවිධාන සම්බන්ධයෙන් මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

නීල් බණ්ඩාර හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව

පිටපත් :

1. ලේකම් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය - දැ.ගැ.පි.
2. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් - ( ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදය සම්බන්ධයෙන් මාගේ DoME/01/11/03/04 – II අංක හා 2018.06.28 දිනැති ලිපිය අනුව)
3. දිස්ත්‍රික් ලේකම් - දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා
4. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී - දිස්ත්‍රික්කයේ සියළුම දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම සඳහා
5. සියළුම අංශ ප්‍රධානීන් - අංශයේ සියළුම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம் 0112186022
Director General

කාර්යාලය/ෆැක්ස්
அலுவலகம் 011 2187131
தொலைநகல
Office /Fax 011 2187133

ගිණුම් අංශය
கணக்குக்கிளை 011 2186173
Accounts Branch

විද්‍යුත් තැපෑල
மின்னஞ்சல
e-mail
dg@dome.gov.lk
info@dome.gov.lk